# අධ්‍යාපනවිද්‍යාවෙහි ශිෂ්‍ය සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය ගුරු භූමිකාවට වැදගත් වන ආකාරය

ඩබ්.එම්.ඩී. ඉන්දිකා පියදර්ශනී සෝමරත්න

## සමාජානුයෝජන සංකල්පය හැඳින්වීම

අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සුවිශේෂ අවධානයක් යොමු වන කරුණක් ලෙස සමාජානුයෝජන සංකල්පය හැඳින්විය හැකි ය. අධ්‍යාපන විශාරදයන් ඉදිරිපත් කර ඇති අදහස් හා නිර්වචන කීපයක් සලකා බැලීමෙන් උක්ත සංකල්පය පිළිබඳ අවබෝධයක් ලද හැකි ය.

"සමාජානුයෝජනය එහි පුළුල් අර්ථයෙන් ගත් කල, පුද්ගලයන් සමාජයේ සාමාජිකත්වය ලැබීමේ හෝ සමාජයේ යම්කිසි කණ්ඩායමක සාමාජිකත්වය ලැබීමේ ක්‍රියාවලිය යි. එය පුද්ගලයන්, අවට සංස්කෘතියේ හෝ උපසංස්කෘතියේ අගයන්, සිරිත් විරිත්, පර්යාලෝක පිළිගන්නේ කෙසේ ද හෝ නො පිළිගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව සම්බන්ධ වී ඇත - ස්ටර්මන් **(Sturman** 1998**)**.

"සමාජානුයෝජනය යනු පිළිසරණක් නොමැති දරුවා, ඔහු හෝ ඇය ඉපදුණ සංස්කෘතියේ පිළිවෙත් පිළිබඳ කුසලතා ලැබ ස්ව සම්ප්‍රජානන සහ දැනුම ඇති පුද්ගලයෙකු බවට පත් කිරීමේ ක්‍රියාවලිය යි. - ගිඩන්ස් (**Giddens** 1989**)**.

"සමාජානුයෝජනය පුද්ගලයන් තම සමාජයේ සංස්කෘතිය අවබෝධ කරගන්නා ක්‍රියාවලිය යි. සමාජානුයෝගී වී නොමැති නම් පුද්ගලයෙකු, ඔහුගේ හෝ ඇයගේ සමාජයේ ප්‍රමිතීන් අනුව සාමාන්‍ය යැයි විග්‍රහ කර ඇති යම්කිසි මිනිසකුට සමාන වන්නේ ඉතා සුළු වශයෙනි." **(Haralambos & Holborn** 1990**)**.

"සමාජානුයෝජනය" සංකල්පය සම්බන්ධ න්‍යායන්

i. ෆ්‍රොයිඩ්ගේ *(Sigmund Freud)* මනෝවිශ්ලේෂී න්‍යාය *(Psychoanalitic Viewpoint)* සමාජානුයෝජනයට සමාජ අත්දැකීම පමණක් නො ව පුද්ගල කායික මානසික බලපෑම මත ඇති බව පෙන්වා දෙයි.

ii. කූලි (C.H.Cooly) ඉදිරිපත් කළ The Looking Glass Self Theory- සමාජ අන්තර් ක්‍රියා මගින් සහ බලවේග මගින් සමාජානුයෝජන කාර්ය සිදු වන බව මෙහි කියැවේ.

iii. මීඩ්ගේ (George Herbert Mead-1924) න්‍යාය- ළමයින් අවට සිටින පුද්ගලයන් අනුකරණය කරමින් සමාජ මානවයන් බවට පත් වන බව මීඩ්ගේ න්‍යායේ හරය වේ.

ඉහත න්‍යායන් අතුරින් මීඩ් න්‍යාය මානව සමාජානුයෝජන කාර්ය පෙන්වන එක් සාධනීය න්‍යායක් ලෙස සැලකිය හැකි ය. මානව දරුවා ස්වකීය පැවත්ම උදෙසා ඔහු වටා ඇති අනෙකුත් සාමාජිකයන්ගේ ආභාසය ලබන අයුරු මෙම න්‍යාය පුරා ඉස්මතු කර ඇත. මීඩ් පෙන්වා දෙන ආකාරයට මානව දරුවා ඔහු ආශ්‍රයේ ජීවත් වන සෙසු අයගේ හැසිරීම සමඟ අනුවර්තනය වෙයි. අනුකරණය කරයි. මෙම අනුකරණය සහ අනුවර්තනය එක්වර සිදුවන්නක් නො වන අතර දරුවාගේ වර්ධන අවස්ථාවන්ට අනුරූපී ව ගොඩනැගෙන අවස්ථා කේන්ද්‍ර කොට ගෙන සිදු වේ. මීඩ් එම අවස්ථා අවධීන් ලෙස හඳුන්වා දෙයි. එනම්,

01. අනුකරණය කිරීමේ අවධිය - The imitation period

02. සෙල්ලම් අවධිය - The play stage

03. ක්‍රීඩා අවධිය යි. - The game stage

මතුපිටින් මෙම අවධීන් සරල බවක් හැඟවූව ද මෙම අවධීන්ගේ ක්‍රියාකාරීත්වය සමස්ත මානව චර්යාවේ දිශානතිය තීරණය කිරීම හා හැඩ ගැස්වීමට බලපායි. මෙයින් පළමු අවස්ථාව කිසිදු විචාරයකින් තොර ව මානව දරුවා සෙස්සන් අනුකරණය කිරීමට පෙලඹෙන අවස්ථාව යි. මුල් වසර දෙක තුළ දරුවාගෙන් විද්‍යමාන වන්නේ සැබවින් ම තමා අවට සිටින පුද්ගලයන්ගේ හැසිරීම යි. එහි අර්ථ කිසිවක් නො දන්නා ඔහු තමාට හැකි අයුරින් අනුකරණය කිරීමට පෙලඹේ. මෙය සමාජානුයෝජන ක්‍රියාවලියේ ප්‍රාථමික අවස්ථාව යි. නිරායාසයෙන් සිදුවන ක්‍රියාවලියක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

දෙවන අවස්ථාවේ දී සෙල්ලම් කිරීම සඳහා දරුවෝ යොමු වෙති. එම අවධියෙහි දරුවෙකුගේ මුළු ජීවිතය ම සෙල්ලම යැයි කිව හැකි තරම් ඊට ඔවුහු ප්‍රිය කරති. අනුකරණයෙන් උපයා ගන්නා ලද අත්දැකීම් සියල්ල ප්‍රායෝගික දැයි තවදුරටත් අත්හදා බැලීම සෙල්ලම් අවධියේ සිදු වේ. මෙම අවස්ථාවේ දක්නට ලැබෙන අනෙක් විශේෂ ලක්ෂණය නම් අනෙක් පුද්ගලයන්ට හිමි භූමිකා පවරා ගැනීමට ඇති නැඹුරුතාව යි. යථාර්ථයෙන් තමන් නියෝජනය නො කරන භූමිකාවක් තමන්ට එළඹුණු විට කෙසේ කටයුතු කළ යුතු දැයි උපකල්පනය කොට ඊට බොහෝ සෙයින් අනුකරණය ද මුසු කොට රඟ දැක්වීම මෙම අවධියේ ස්වභාවය යි. එම ක්‍රියාවලීන්ට අමතර ව සෙල්ලම් අවධියේ පසුවන දරුවෝ විනයඃ dicipline) හා ස්වයං පාලනය (self-control) ගැන අවබෝධයක් ද ලබති. උදාහරණ වශයෙන් මේ දක්වා අනිච්ඡානුග ක්‍රියාවලීන් ලෙස පැවති ශරීර කෘත්‍ය කිරීම් ආදිය ස්වකීය පාලනය යටතට ගැනීම සඳහා පෙලඹෙති. සමාජානුයෝජන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මෙකී කාරණය වැදගත් වන්නේ අනෙක් අය සමඟ කෙරෙන අන්තර් ක්‍රියාවලියේ දී නිවැරදි

හැසිරීම තීරණය කිරීමට හා ක්‍රියාවේ යෙදවීමට ගන්නා වෑයම සලකා බැලීමෙනි. එසේ ම සමාජානුයෝගී ක්‍රියාවලියක ස්ව-සංකල්පය සකස් වීමේ පදනම මෙයින් සකස් වන බව පෙනේ.

මීඩ් මානව සමායෝජන ක්‍රියාවලියේ තෙවන අවස්ථාව ලෙස දක්වනුයේ ක්‍රීඩා කිරීමේ අවධිය යි. මෙය සංකීර්ණ ක්‍රියාකාරී අවධියකි. ක්‍රීඩාවක නියැළීමේ දී මෙන් ම මෙම අවධිය තුළ පසු වන දරුවා තමා අවට සිටින පුද්ගලයන් පිළිබඳ අවබෝධය ලබමින් තමා ද භූමිකා කීපයක කාර්ය ඉටු කරයි. තමාගේ අරමුණු සාධනය පමණක් නො ව සමූහයකගේ අරමුණු සාධනය සඳහා සිය දායකත්වය ලබා දීම පිළිබඳ ව කල්පනා කරන අවස්ථාවකි. මෙය සමාජානුයෝජනය සිදු වන සංස්කෘතික අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යි. මෙම හැසිරීම් රටාවේ දිග හැරුමක් ලෙස මානවයාගේ සිය ජීවිත කාලය හැඳින්වීම වරද නො වේ.

## අධ්‍යාපන ක්‍රියාවලියට සමාජානුයෝජනය පිළිබඳ අවබෝධයේ වැදගත්කම

සමාජානුයෝජන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාසලට පැවරෙන අනන්‍ය සාධාරණ කාර්යභාරය පිළිබඳ අවිවාදයෙන් පිළිගත යුතු ව ඇත. පාසල නැමති ආයතනයේ ජීවමය ක්‍රියාකාරීත්වය ගුරුවරයා මගින් පළ කෙරේ. පාසල, ගුරුවරයා මගින් ඉටු කරන සමාජානුයෝජන කාර්ය කිසිවිටෙකත් සරල හෝ ඍජු නො වේ. පාසල ක්‍රියාත්මක වන්නේ විශාල සමාජ පසුබිමක ය. එම විශාල සමාජ පසුබිම මගින් ඇති කරන බලවේගයන්ගේ අඛණ්ඩ බලපෑමට පාසල මුහුණ දෙයි. සමාජ උප සංස්කෘතීන් නිසා පාසලෙන් කෙරෙන සාමාජානුයෝජන සමපාත අයුරකින් කළ හැකි නො වේ. එනමුත් ගුරුවරයෙක් හට සමාජානුයේජන ක්‍රියාවලියේ හරයන් පිළිබඳ අවබෝධයක් ඇතිනම් එම ස්වභාවය සතුටුදායක අයුරින් අභිභවනය කළ හැකි ය. හෙවත් ශිෂ්‍ය සමාජානුයෝජනයට අදාළ න්‍යායාත්මක කරුණු පිළිබඳ අවබෝධයක් ඇති ගුරුවරයෙකුට සිසු සමාජානුයෝජනය සඳහා පහත පරිදි සහාය කර ගත හැකි ය.

### i. ශිෂ්‍යයා පිළිබඳ නිවැරදි හා පැහැදිලි අවබෝධයක් ලැබීමට

පාසලේ අප ඉදිරියට පැමිණෙන දරුවන් විවිධාකාර ය. ඔවුන් වයසින් එක් තාරාවක් (rank) නියෝජනය කළ ද ඒ හැර ඔවුනට අයත් කායික, මානසික හා චිත්තවේගික යන සියලු අංශයන්ගෙන් එකිනෙකාට අනන්‍ය ස්වභාවයක් දරති. දරුවා වෙත ශිල්ප ඥානය ලබා දීමට පෙර දල වශයෙන්වත් ඔවුනගේ සාමාජීය පසුබිම පිළිබඳ අවබෝධයක් තිබීම අවශ්‍ය ය. තව ද ගුරුවරයා ශිෂ්‍යයා ශිල්ප ඥානය ලබා දෙමින් සමාජානුයෝජනය කිරීමේ කාර්ය ද මෙහෙය විය යුතු ව ඇත. ඊට සමාජානුයෝජන න්‍යායන් පිළිබඳ අවබෝධය මහත් ආලෝකයක් සපයයි.

උදාහරණ වශයෙන් සාමාජානුයෝජනය සම්බන්ධ කුලි, මීඩ් න්‍යායන්ගෙන් වැඩිහිටි ප්‍රජාව දරුවන් කෙරෙහි කරන බලපෑම විග්‍රහ කරයි. එහෙත් සමාජානුයෝජන ක්‍රියාවලියේ දී මෙම ස්වභාවයට ප්‍රතිපක්ෂව දරුවා කෙරෙන් ද සමාජානුයෝගීකාරකයක් නිර්මාණය වී ඔහුගේ චර්යා ඉස්මතු වන ආකාරයක් දක්වා

ඇත. ෆ්‍රොයිඩ්ගේ විශ්ලේෂණය තුළ ද දක්නට ඇත්තේ මෙම ස්වභාවය යි. ළමයා ද සමාජානුයෝජන කාරකයකු ලෙස මේ අනුව සැලකිය යුතුවෙයි. මෙම කරුණ තව දුරටත් පැහැදිලි කරන්නේ නම් දෙමව්පියෝ තම දරුවන් විවිධ වෙර ගැන්වීම් මත පාලනය කරති. එසේ ළමා ප්‍රතිචාර සකස් කර ගනී. මනෝ චිකිත්සකයෙකු තම රෝගීයාගේ හැසිරීම පාලනය කරන්නේ ඔහු සාර්ථක ලෙස රෝගීන් සුව කළ ආකාරයෙන් ය. පන්ති කාමරයක දී ළමයින්ගේ ක්‍රියාකාරීත්වය මත ගුරුවරයා තම පන්තිය කරගෙන යයි. මේ අර්ථයෙන් ගත් විට චිකිත්සකයා රෝගියා පාලනය කරයි. ළමයා දෙමව්පියන් පාලනය කරයි. ශිෂ්‍යයන් ගුරුවරුන් පාලනය කරයි. මෙම විග්‍රහයට අනුව ශිෂ්‍යයා ස්වාධීන සමාජානුයෝජක කාරකයක් ලෙස අවබෝධ කර ගැනීමට ඊට අදාළ න්‍යායන් මඟ පෙන්වන බව පැහැදිලි ය.

## ii. පාසල සමාජ සමූහයක් ලෙස අවබෝධ කර ගැනීමට

සමාජයක පුද්ගල ක්‍රියාකාරීත්වය හුදෙකලා ස්වභාවයක් නො දරයි. එකිනෙකාගේ ක්‍රියාකාරකම් අනෙක් පුද්ගලයා වෙත නොයෙක් අයුරින් බලපායි. පාසල ද එබඳු සංකීර්ණ සමාජ කණ්ඩායමක් ලෙස හඳුනාගත හැකි ය. ගුරුවරුන් කරන මඟ පෙන්වීම් සමස්ත පාසල් සමාජය වෙත ම බලපායි. මීඩ් සඳහන් කළ පරිදි දරුවන් අනුකරණය සඳහා පෙළඹෙන්නේ ඉතා වේගයෙනි. පාසල් පද්ධතිය තුළ එබඳු අනුකරණයකට ගැළපෙන පරිදි ගුරුවරුන් ස්වකීය චර්යාව සකස් කර ගත යුතු ම ය.

මෙම අවශ්‍යතාව වඩාත් ඉස්මතු වීමට බලපාන කරුණක් වනුයේ පාසල සංස්කෘතික දායාදයන් සම්ප්‍රේෂණය කරන මධ්‍යස්ථායක් ය යන අදහස සැලකිල්ලට ගැනීමෙනි. සමාජය මගින් පිළිගෙන ඇති අගයන්, ප්‍රතිමානයන් හා සම්ප්‍රදායානුගත සම්මතයන් පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමත් ඒවාට අනුකූල ජීවන ක්‍රමය සකස් කරගැනීමටත් අදාළ පෙරහුරුව පාසලෙන් ලැබේ. පාසල මගින් ඒ සඳහා දැනුමත් ආකල්ප හා කුසලතා ද සම්පාදනය කර දිය යුතු ය. මෙ නයින් පාසල අන් ආයතන සමඟ සසඳා බැලූ විට සමාජ සංස්ථාවක් ලෙස සැලකීම උචිත ය. එම සමාජ සංස්ථාව නිවැරදි දිශානතියක ගමන් කරවීමට සංස්කෘතිය පවරා දීමක් අවශ්‍ය වන අතර ඒ සඳහා සමාජානුයෝජන ක්‍රමවේදය පිළිබඳ අවබෝධය හා භාවිතය වැදගත් ය.

## iii. පාසලෙන් සමාජ හැකියා ඇති දරුවන් බිහි කිරීමට

බුද්ධිමත් ලෙස සමාජයට අනුගත කිරීමට මිනිසුන්ට ඉගැන්වීමට පාසලට හැකි නම්, එ වැනි සංස්කෘතියකට ඉතා ම ඉහළ මට්ටමට දියුණු වීමට ඉහළ ප්‍රවණතාවක් ඇති බව ඒ. ගුඩ්, ඩී.ඒ.එල් වුඩ් වැනි අධ්‍යාපන සමාජ විද්‍යාඥයන්ගේ මතය යි. පාසලේ සිටින දරුවන් සියල්ල සමාන දක්ෂතාවලින් හෙබියේ නො වේ. අතළොස්සක් සුහග හා දන්ධ දරුවන් අතර බහුතරය මධ්‍යම ප්‍රමාණයේ ඉගෙනුම් ඵලයක් පෙන්වන දරුවෝ ය. මොවුන් අතුරින් ඉගෙනීමේ පසුබටට දරුවන් එම ස්වභාවයට පත්වීම සම්බන්ධයෙන් නො වැළැක්විය හැකි සාධක මෙන් ම අභිභවනය

කළ හැකි සාධකවලින් යුක්ත දරුවන් ද සිටිය හැකි ය. කුලි පෙන්වා දෙන ලෙසින් ඔවුන් පසුබට වීම සඳහා ඔවුනගේ ස්ව සංකල්පය නිවැරදි ලෙස හඳුනා නොගැනීම බලපාන්නට ඇත. එසේ නැතහොත් මීඩ් සඳහන් කළ පරිදි සෘණාත්මක ආදර්ශනයක් හෙවත් භූමිකාවක් අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ද විය හැකි ය. මෙම තත්වය අනාවරණය කර ගැනීමේ හැකියාව සමාජානුයෝජනය පිළිබඳ අවබෝධයක් ඇති ගුරුවරයාට නිතැතින් ම ලැබෙන අතර ඔහු ඒවාට විසඳුම් නිර්මාණය කරනුයේ ද එම කරුණු සැලකිල්ලට ගනිමිනි.

## iv. ශිෂ්‍ය මාර්ගෝපදේශනය සඳහා

ඉගැන්වීමේ කාර්යට අමතර ව ගුරුවරුන්ට නිතැතින් ම උපදේශන භූමිකාව ද හිමි වේ. සත්‍ය වශයෙන් ම ගුරුවරු ශිෂ්‍යයන්ගේ ස්ථානීය දෙමාපියන් ය. ගුරුවරුනට දරුවන්ගේ පෞද්ගලික ගැටලු මඟහැර සිටීමට හැකියාවක් නැත. එ බැවින් සුදුසු මඟ පෙන්වීම සඳහා ගුරුවරුන් ද නිරන්තරයෙන් කැප විය යුතු ය. සමාජානුයෝජන පිළිබඳ යථෝක්ත න්‍යායන් ගුරුවරුන්ට උපදේශන භූමිකාව සුමට ලෙසින් ඉටු කිරීමට සහාය වෙයි. උදාහරණ වශයෙන් දරුවෙකු තුළ මතු වන අපගාමී චර්යාවක් දෙස අවධානය යොමු කරමු.

සමාජානුයෝජනය පිළිබඳ විග්‍රහ වන න්‍යායන් අතර ප්‍රොයිඩ්ගේ න්‍යාය මේ සම්බන්ධයෙන් කවර විග්‍රහයක් කරන්නේ ද? ඒ පිළිබඳ අවබෝධයකින් තොර අයෙකුට ක්ෂණික ව මෙම අපගාමී චර්යාව සමාජයේ කවර හෝ බලපෑමක් නිසා දරුවා තුළ ඇති විනැයි තීරණය කළ හැකි ය. එහෙත් ප්‍රොයිඩ්ගේ විග්‍රහයට අනුව පුද්ගල පරිණතිය ද එක්තරා ආකාරයක සමාජානුයෝජන ස්වභාවයකි. ඒ අනුව පුද්ගලයා සමාජානුයෝජනයට යොමු වීම එක්තරා ආකාරයකින් පුද්ගලයාගේ ජීව විද්‍යාත්මක ස්වභාවයකි. බිළිඳු වියේ සිට වැඩිහිටි කාලය දක්වා සංවර්ධන අවධි කීපයක් ගත කරන පුද්ගලයාට මුල් කාලීන ව ලැබුණු අත්දැකීම් ආශ්‍රයෙන් පසු කාලීන පෞරුෂය, චර්යාව තීරණය වෙයි. සමහර විටෙක පුද්ගලයෙකුගෙන් මතුවන අපගාමී චර්යා මෙබඳු නිලීන අත්දැකීම්වල ප්‍රකට වීමක් විය හැකි ය. ප්‍රොයිඩ් ඉදිරිපත් කළ මෙම විග්‍රහය පිළිබඳ අවබෝධයක් ඇති ගුරුවරයා සෘජු ව ම ප්‍රශ්නය දෙස නො බලා ඊට පසුබිම් වූ කරුණු පිළිබඳ ව ද සලකා නිසි මඟ පෙන්වීමක් සිදු කරනු ඇත.

## v. තත් කාලීන සමාජ ප්‍රවණතා සැලකිල්ල ගනිමින් අනාගත අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීමට

ඕනෑම සමාජයක අධ්‍යාපනය ක්‍රියාවලිය වූ කලී නිරන්තරයෙන් වෙනස්වීමේ ස්වභාවය දරන්නේ ය. ඒ අනුව ඊයේ ලද දැනුම අදට වලංගු නො විය හැකි අතර අද උපයා ගන්නා ලද දැනුම හෙට නිෂ්ප්‍රයෝජන විය හැකි ය. සමාජීය තත්වයන්ගේ වෙනස්කම් ඇති වුව ද සමාජය තුළ මිනිස් අනුවර්තනය වීමේ මූලධර්මය වෙනස් වන්නේ ඉතා කලාතුරකිනි. ඒ අනුව සමාජානුයෝජන අවබෝධය ඇති ගුරුවරයෙකුට එහි මූල ධර්මමය අවබෝධයක සිට පෞද්ගලිකවත් පොදුවේත් සිය අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කළ හැකි ය.

උදාහරණ වශයෙන් මීඩ්ගේ සමාජානුයෝජන න්‍යාය සම්බන්ධයෙන් සලකන විට දරුවෙකු සිය සමාජානුවර්තන අවස්ථාව වෙත ළඟාවනුයේ අවස්ථා ත්‍රිත්වයක් යටතේ ය. බිළිඳු විය අනුකරණය කිරීමේ ලැදියාවෙන් යුක්ත වන අතර ඉන් අනතුරු ව එළඹෙන්නේ සෙල්ලම් අවධිය යි. මෙම සෙල්ලම් අවධිය භූමිකා පවරා ගනිමින් අනුකරණයේ යෙදෙන අවස්ථාවකි. ගුරුවරයා ඉගෙනුම් අවස්ථා සංවිධානය කළ යුත්තේ ද මෙම ස්වභාවය සැලකිල්ලට ගැනීමෙනි. ඔහුට සම්මත නීති රාශියක් පිළිපදිමින් සමාජයේ බොහෝ දෙනාගේ භූමිකා පවරා ගනිමින් ක්‍රියා කෙරෙන ක්‍රීඩා අවධිය අනුව කටයුතු කළ හැකි නො වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජයසේන, අශෝකා. (2010) **අධ්‍යාපන සමාජ විද්‍යාව**, කොළඹ: ගොඩගේ ප්‍රකාශන.

ගලගමගේ. එස්. (1996) **පාසල් සංස්කෘතිය සිසුන් මෙහෙයවීමේ බලවේගයයි**, කොළඹ: ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රවර්ධන සංගමය.

ගුණවර්ධන, චන්ද්‍රා. (1995) **අධ්‍යාපනය හා සමාජ සාධක**, කොට්ටාව: සාර ප්‍රකාශන.

රතනපාල, නන්දසේන. (1998) **සමාජවිද්‍යා මූලධර්ම**, කොළඹ: සීමාසහිත ලේක් හවුස් සමාගම.

බණ්ඩාරනායක, අභය. (1994) **සමාජ මනෝවිද්‍යාවේ මූලික සංකල්ප**, කොට්ටාව : සාර ප්‍රකාශන

රූපසිංහ.එස්. (1985) **සමාජීය පාසල් පරිසර සාදක සමඟ අධ්‍යාපනය දක්වන සම්බන්ධතාව**, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමයේ ප්‍රකාශනයකි.

හේමන්ත කුමාර, එන්. වී.ජී. (2001) **සමාජ විද්‍යා මූලික සංකල්ප හැඳින්වීමක්**, මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

හේමන්ත කුමාර, එන්. වී.ජී. (1997) **සමාජ විද්‍යාව හා මානව විද්‍යා ප්‍රවේශය**, කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ

Deal (1920) **Organizational climate and culture**, Encyclopaedia of Eduacational Research" 6th edition, New York: Macmillan.

Goodlad, J.I. (1984) **A Place called School**, New York: McGraw-Hill.

Harighurst, R.J. & Neugarten, B.L (1957) **Society and Education**, Allyn & Bacon Inc.

Holt, John.(1967) **How Children Learn**, New York: Pitman Publishing.

Ottaway, A.K.C. (1966) **Education and Society**, Rontle and Kegan Paul.